## වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අගෝස්තු 15 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 16 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී කැබ් රථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.50,000 ක ණය මුදල කපා හැර මුද්දර ගාස්තු ආදායමෙන් අය කරගැනීම ගිණුම් ගත කිරීම සඳහා පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ණය ගිණුම රු.50,000 ක් හර කර ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම රු.50,000 ක් බැර කළ යුතු වුවත් සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගත් රු.17,205 ක් වටිනා ෆැක්ස් යන්ත්‍රය පුනරාවර්තන වියදමක් වශයෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ඉත්තපාන උප කාර්යාලයේ ආදායම් රැස්කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ බැංකුව විසින් අයකරගෙන තිබූ කොමිස් මුදල රු.50,854 ක් හා පසුගිය වර්ෂයන් වෙනුවෙන් අයකර ගෙන තිබූ රු.581,997 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.809,505 ක් වූ මුද්දර ගාස්තු ආදායම සමුච්චිත අරමුදල් ගිණුමට ගිණුම් ගත කර නොතිබුණි.

1.3.2 **<u>නොසැසඳූ පාලන ගිණුම්</u>**

(අ) ගිණුම් විෂයයන් 09 ක් සඳහා ගිණුම් අනුව ශේෂය රු.38,635,942 ක් වුවත් ඒවාට අදාල උපලේඛන අනුව ශේෂය රු. 38,107,506 ක් වූයෙන් රු.528,436 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ අත්තිකාරම් උපලේඛනයේ සඳහන් නොවූ 2009 සිට 2014 දක්වා වර්ෂවලට අයත් රු.344,925 ක්, නොපියවූ අත්තිකාරම් ලෙස අත්තිකාරම් ලේඛනයේ දක්වා තිබුණි.

1.3.3 **<u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>**

විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.116,206,059 ක් වූ ගිණුම් ශේෂ 4 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 **<u>නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්</u>**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

**<u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u>**

(i) මුදල් රෙගාලසි 371(අ) ප්‍රකාරව කිසියම් කාර්යයක් සඳහා දෙනු ලබන අත්තිකාරම් මුදලක් එම කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවද 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ලබාදී තිබූ රු.115,000 ක් වූ අත්තිකාරම් විගණිත දිනය වූ 2016 ජනවාරි 26 දින වන විටත් පියවා නොතිබුණි.

(ii) මුදල් රෙගාලසි 396(ඈ) ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ ජංගම ගිණුම් දෙකකට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශනවල නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ රු.275,404 ක් වූ චෙක්පත් 57 ක් සම්බන්ධයෙන් 2016 අප්‍රේල් මාසය දක්වාත් කටයුතු කර නොතිබුණි.

(iii) මුදල් රෙගාලසි 1645 ප්‍රකාරව වාහන ලොග් සටහන් පොත් පවත්වා ගත යුතු වුවත්, සභාව කිසිදු වාහනයක් සම්බන්ධයෙන් ලොග් සටහන් පොත් ලියා නොතිබුණි.

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2:1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.7,058,430 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 1,288,035 ක් විය.

## 2:2 ආදායම් පරිපාලනය

### 2.2.1 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.2,732,630 ක් වූ හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති වල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

### 2.2.2 වරිපනම් බදු

2015 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් බදු ශේෂය වූ රු.1,852,765 කින් සමාලෝචිත වර්ෂය තුළදී රු.745,276 ක මුදලක් ලැබී තිබූ අතර හිඟ මුදල් අයවීමේ ප්‍රගතිය සියයට 40.23 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී බිල් කර තිබූ වරිපනම් බදු ආදායම රු.1,962,122 ක් වූ අතර ඉන් රු.1,107,252 ක මුදලක් එනම් සියයට 56.43 ක් වර්ෂය තුළදී අයකරගෙන තිබුණි.

### 2.2.3 අක්කර බදු

2015 වර්ෂය සඳහා අක්කර බදු බිල් කිරීම රු.14,822 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 වන විට ඉන් රු.4,335 ක් පමණක් එනම් සියයට 29 ක් පමණක් අයකරගෙන තිබුණි. 2014 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය රු.70,268 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 වන විට ඉන් රු.5,959 ක් එනම් සියයට 8 ක් පමණක් අයකරගෙන තිබුණි.

### 2.2.4 කර්මාන්ත බදු

2014 දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත බදු ශේෂය රු.119,210 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 වන විට ඉන් රු.35,000 ක් එනම් සියයට 29 ක් පමණක් අයකරගෙන තිබුණි.

### 2.2.5 මස්කඩ කුලී

2014 දෙසැම්බර් 31 දිනට හිඟ මස්කඩ කුලී ශේෂය රු.56,636 ක් වූ අතර 2015 වර්ෂය තුළ ඉන් කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

### 2.2.6 ප්‍රචාරක දැන්වීම් ගාස්තු

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සවි කර ඇති නාම පුවරු/ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබීම නිසා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇති නාම පුවරු/ දැන්වීම් පුවරුවලින් ගාස්තු අයකිරීමට නොහැකි වී තිබුණි.

2.2.7 **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 9,878,212 ක මුදලක් පහත පරිදි ලැබිය යුතුව තිබුණි.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 7,409,907 |
| මුද්දර ගාස්තු | 2,468,305 |

2.2.8 **<u>ඉඩම් විකුණුම් ගාස්තු</u>**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසි කිරීමේදී වෙන්දේසි කරනු ලබන ඉඩම්වල විකුණුම් මිලෙන් සියයට 1 ක ආදායමක් සභාව විසින් ලබා ගත යුතු වුවත් එසේ සිදු නොකර සභාවේ ආදායම් පරිපාලක විසින් නිශ්චය කර තිබූ දල ඇස්තමේන්තුවෙන් සියයට 1 ක මුදල වශයෙන් රු.244,357 ක් ඉඩම් විකිණීම් 02 කින් 2014 වර්ෂයේදී ලබාගෙන තිබූ අතර දළ ඇස්තමේන්තුව හා වෙළඳපොල විකුණුම් වටිනාකම අතර වෙනස ගලපා ඉතිරි මුදල් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

(අ) වාහන අළුත්වැඩියා ලේඛනය අනුව, වර්ෂ ගණනාවක සිට අළුත්වැඩියාවක් නොකෙරුණු හා ධාවනය නොවන ජේසීබී යන්ත්‍ර 02 ක්, කැබ් රථ 02 ක්, ට්‍රැක්ටර් 04 ක්, අත් ට්‍රැක්ටර් 03 ක්, ටිපර් රථයක්, ත්‍රීවීලර් රථයක් සභා පරිශ්‍රයේ ගාල් කර තිබුණි.

(ආ) සභාවේ සේවය කරනු ලබන තාවකාලික හා අනියම් සේවකයින් වෙනුවෙන් ගෙවනු ලබන සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් වාරික දිගු කාලසීමාවක සිටම නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු.129,868 ක මුදලක් එම අරමුදලට අධිභාර වශයෙන් ගෙවීමට සිදු වී තිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය